# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,900 — 1970 අප්‍රේල් 3 වැනි සිකුරාද — 1970.4.3

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි.)

# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)



| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 295 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | 301 |
| තනතුරු-ඇබෑර්තු ... ... ... | 296 | අය-වැය ලේඛන ... ... ... | 302 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 299 | දේපල විකිණීම ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — | මාර්ග කොමිටි දන්වීම ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දන්වීම ... | 299 | විවිධ දන්වීම ... ... ... ... | 302 |



සැලකිය යුතුයි.—1966 ජනවාරි සිට ජූනි දක්වා නිකුත් අංක 14,605 සිට 14,701/4 දක්වා ඇති ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රිකාවන්ට සූචියක් මෙම ගැසට් පත්‍රයට අතිරේකයක් වශයෙන් පළවේ.

## පළාත් පාලන නිවේදන

ඇල්. ඩී.—බී. 139/46

### විනෝද බදු ආඥාපනත

(267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ දෙහිගම්පල් කෝරළේ මෙගොඩපොත පත්තුව ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගනු ලැබූ පහත දැක්වෙන යෝජනාව පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරනු ලැබ, ඒ වගන්තියේ (2) වැනි උපවගන්තිය අනුව පළ කරනු ලැබේ.

#### යෝජනාව

"(267 වන අධිකාරය වන) විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මේ සභාව විසින්, සභාවේ පරිපාලන සීමාව ඇතුළත ප්‍රදේශයෙහි පැවැත්වෙන (ඒ ආඥා පනතේ විස්තර කර ඇති) විනෝද කටයුතු සඳහා ඇතුළුවීම පිණිස අයකරනු ලබන ගෙවීම්වලින්, මෙහි පහත දැක්වෙන ප්‍රමාණ අනුව, බද්දක්, මේ යෝජනාව ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන දින සිට මෙයින් පනවා අයකරනු ලැබේ."

| ගෙවන මුදල | බදු ප්‍රමාණය රු. ශ. |
|---|---|
| බදු ප්‍රමාණය හැර ප්‍රවේශ ගාස්තු— | |
| (අ) ශත 20 ට අඩු නොවන නමුත් ශත 50 ට වැඩි නොවන විට ... ... ... | 0 05 |
| (ආ) ශත 50 ට වැඩි වන නමුත් රු. 1 ට වැඩි නොවන විට ... ... ... | 0 10 |
| (ඇ) රු. 1 ට වැඩි වන නමුත් රු. 1.50 ට වැඩි නොවන විට ... ... ... | 0 15 |
| (ඈ) රු. 1.50 ට වැඩි වන නමුත් රු. 2 ට වැඩි නොවන විට ... ... ... | 0 20 |
| (ඉ) රු. 2 ට වැඩි වන නමුත් රු. 3 ට වැඩි නොවන විට ... ... ... | 0 30 |
| (ඊ) රු. 3 ට වැඩි වන නමුත් රු. 4 ට වැඩි නොවන විට ... ... ... | 0 40 |
| (උ) රු. 4 ට වැඩි වන නමුත් රු. 5 ට වැඩි නොවන විට ... ... ... | 0 50 |
| (ඌ) රු. 5 ට වැඩි වන නමුත් රු. 10 ට වැඩි නොවන විට ... ... ... | 1 0 |
| (එ) රු. 10 ට වැඩි වන විට— | |
| (1) පළමුවැනි රු. 10 ට ... ... | 1 0 |
| (2) ඊට අතිරේකව එක් එක් රු. 5 ට හෝ ඉන් කොටසකට ... ... | 1 0 |

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 මාර්තු 16 වැනි දින,
කොළඹ දීය.

4–166—70.4.3 දින අංක 14,900 දරන ගැසට් පත්‍රය

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දන්වීම් පිළිබඳ**

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

(පහත සඳහන් (iii) (අ), (ආ) සහ (v) දරන කොන්දේසි දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් සේවයට බඳවා ගනු ලැබූවන් කෙරෙහි යෙදෙයි.)

සටහන 1.—මේ කරුණ සම්බන්ධයෙන් "නව ප්‍රවේශක නිලධාරී" යන පදයෙන් අදහස් කරන්නේ 1960 ජනවාරි 29 වැනි දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරනු ලබන දැන්වීම්වලට අනුකූලව පළාත් පාලන සේවා තනතුරුවලට පත්කර ගනු ලබන නිලධාරීන් ය.

සටහන 2.—රජයේ සේවයෙහි නියැලිව සිට පළාත් පාලන සේවයේ තනතුරු භාර ගැනීම සඳහා සේවයෙන් නිදහස් කරනු ලබන්නා වූ "ආදි ප්‍රවේශක නිළධාරීන්" කෙරෙහි ඉහත 4 වැනි ඡේදයේ (iii) (අ), (ආ) සහ (ඇ) හි සඳහන් විධිවිධාන අදාළ නොවේ.

5. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවකු විසින් ද, තමා ලාංකිකයකු බවට සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතුය. පළාත් පාලන සේවයට බඳවා ගැනීම සම්බන්ධ සියලුම කටයුතු සඳහා "ලාංකික" යන වචනයෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචිකරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.

6. සේවා මුක්ත භටයින් සඳහා අනුග්‍රහ.—(අ) සේවා මුක්ත වූ අයදුම්කරුවනට, ඔවුන්ගේ නිත්‍ය භට හමුදා සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම් කර ඇති තනතුරුවල නියමිත උපරිම වයස් සීමාව ඇතුළතට පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය භට සේවා කාලපරිච්ඡේදය එසේ අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටියෙහි නියමිත අඩුම අධ්‍යාපන සුදුසුකම් ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවා මුක්තයන් වන අයදුම්කරුවනට අවසර දෙනු ලැබේ.

7. වයස පිළිබඳ අනුග්‍රහය.—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකා ම අයදුම්පත් එවීමට ස්ථිර තනතුරක් දරන වර්ෂ දෙකක අඛණ්ඩ සේවාවක් ඇති ප්‍රාදේශීය බලමණ්ඩලයන්හි සේවකයන්ට පුළුවන.

8. වෙනත් අවශ්‍ය කරුණු.—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩල සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයේ ස්ථිර තනතුරු දරණ නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුව හොත් ඔවුන් ස්වකීය තනතුරුවලින් මුදාගන්නට තමන් සූදානම්ව සිටීත් ද නැද්දැයි සඳහන් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක්, අන්කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත් ඒ හේතුවෙන්ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම් කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

(vii) පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත්, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්‍යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකා බලනු නොලැබේ. අයදුම්පතක් තැපැලේදී, ප්‍රමාද වූ බවට හෝ නැති වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූද ඒ අවදානමට මුහුණ පාති.

**අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම්පත් ආකෘතිය**

## පළාත් පාලන සේවය

සැ.යු.–(i) අයදුම් පත්‍ර පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට, තනතුරු අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන්, අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම්පත්‍ර ලේකම්ගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැළකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදාළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත් අයදුම්කරුවෝ ස්වකීය අයදුම්පත්‍රවලට ඈමිණිය යුතුය. (1) ඉංග්‍රීසි, සිංහල, දෙමළ යන භාෂාවලින් සමත්වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය, (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදාළ වන වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැළකිල්ල යොමු කරන්න.

————————තනතුර සඳහා වූ අයදුම් පත

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය :———.

(ආ) ඉල්ලුම් කර සිටින තනතුර :———.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :———.

ජාතිය :———.

(එම ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත්, හැඳුනුම් අංකයත් සඳහන් කරන්න)

3. තැපැල් ලිපිනය :———.

(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස
අවුරුදු :———, මාස :———, දින :———.

(ආ) උපන් දිනය :—

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :———.

(ආ) අයදුම්කරුගේ පියා :———.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :———.

(ඈ) අයදුම්කරුගේ පියා සහ මුත්තා :———.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ), (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඉ) හෝ පිරවිය යුතුයි.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :———.

7. වයස අවුරුදු 12 සිට ඉගෙනගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

**8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමග :—**

**(අ) සිංහල :————.**

**(ආ) ඉංග්‍රීසි :————.**

**(ඇ) ශඳමළ :————.**

**9. ලබාගෙන ඇති වෘත්තීය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතන වල නම් :————.**

**10. ඉගෙන ගත් පාඨශාලා හා එයින් අස්වූ දිනය :————.**

**11. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයන් හා අස් වූ දිනයන් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න) : ————.**

**(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.**

**(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු) පළාත් පාලනායතන හා කාලසීමාවන් :————.**

**(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—**

**(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත්වූ දිනය :————.**

**(ii) දීමනා හැර දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.**

**(iii) විශ්‍රාම වැටුප් සහිතද ? :————.**

**(ඉ) සේවා මුක්ත හටයෙක් නම් :**

**සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දිනය හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.**

**12. කියවීම, ලිවීම, කතා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :—**

**(අ) සිංහල :————.**

**(ආ) දෙමළ :————.**

**13. විශේෂ සුදුසුකම්.—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම් ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.**

**14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද ? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.**

**15. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නැත්නම් ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කොපමණ ද ? :————.**

**16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.**

**17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.**

**(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)**

**මේ අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයාගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මං සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.**

**————.**

**අයදුම්කරුගේ අත්සන.**

**දිනය :————.**

**ලේකම්,**
**පළාත් පාලන සේවා කොමිෂන් සභාව,**
**තැපැල් පෙට්ටිය 530, කොළඹ 1.**

---

## පළාත් පාලන සේවය

### සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි. තෝරාගනු ලබන අයදුම්කරු මාරුවීමට යටත් වෙයි.

2. තෝරාගනු ලබන අයදුම්කරු ප්‍රථමයෙන් මහනුවර නගර සභාවට පත් කරනු ලබන අතර, ප්‍රාදේශීය බලමංඩල සීමාව තුළ වාසය කිරීමට නියම කරනු ලැබේ. පෞද්ගලික වෘත්තියෙහි යෙදීමට අවසර නැත.

3. **වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රු. 11,520—180 × 9—600 × 4—රු. 18,240. වර්ෂයකට රු. 14,880 ට පෙර කාර්යක්ෂමතා කඩයිම. මීට අමතරව රජයේ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව විවාහක දීමනාවක්, විවාහක නිලධාරීන්ට ගෙවනු ලැබේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—පහත සඳහන් එක් සුදුසුකමක් සහිතව අයදුම්කරුවන්ට ඇම්.බී.බී.ඇස් (ලංකා) හෝ ලංකාවේ ලියාපදිංචි කළ හැකි වෙනත් සමාන වෛද්‍ය සුදුසුකමක් තිබිය යුතුය :—

(අ) රාජ්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ ඇම්.ඩී. (ලන්ඩන්) ;

(ආ) බ්‍රිතාන්‍ය විශ්ව විද්‍යාලයක හෝ ටොරොන්ටෝහි ඩී.පී.එච්. ;

(ඇ) ඇම්.පී.එච්., (හාවාඩ්) ;

(ඈ) මහජන සෞඛ්‍ය පිළිබඳ ඇම්.ආර්.සී.පී. (ලන්ඩන්) හෝ (එඩින්බරෝ).

5. මහජන සෞඛ්‍ය වැඩ පිළිබඳ පළපුරුද්ද ඇති අයදුම්කරුවන්ට විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ. තෝරාගනු ලබන අයදුම්කරු, ඔහුගේ සුදුසුකම් සහ පළපුරුද්ද අනුව, ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ සුදුසු වැටුප් පෙත්තක තබනු ලැබේ.

6. රජයේ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව විශ්‍රාම වැටුප් රහිත දීමනා ගෙවනු ලැබේ.

7. මේ ගැසට් පත්‍රයේ ආරම්භයේ පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

8. **ඉල්ලුම් පත්‍ර.**—පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙළ කොට, 1970. 4. 22 වැනි දිනට හෝ ඊට පළමු, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුයි.

සඳහන් කරන ලද ආකෘති පත්‍රයේහි 13 වැනි ඡේදය වෙනුවට පහත සඳහන් කරුණු යොදාගත යුතුයි :—

"13. (අ) ලබාඇති වෛද්‍ය සහ වෘත්තීය සුදුසුකම්, ඒවා ලබාගත් දින සහ ආයතනයන්ගේ නම් සහිතව :————.

(ආ) මහජන සෞඛ්‍ය වැඩවල ඇති පළපුරුද්ද පිළිබඳ විස්තර :————.

9. අයදුම්පත්‍ර හෝ අදාළ අනිකුත් ලියුම් එවිය යුත්තේ, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

10. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අවසන් දිනට පෙර ලැබුණු බවට සහතික කර, ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

11. සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

ඒ. බී. සමරජීව,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 මාර්තු මස 22 වැනි දින,
කොළඹ, තැ. පෙ. 530,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.

4–156—70.4.3 දින අංක 14,900 දරන ගැසට් පත්‍රය

## පළාත් පාලන සේවය

### මෝටර් ගරාජයේ ෆෝර්මන් තනතුර

යථෝක්ත තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

2. තනතුරට අදාළ වැටුප් ක්‍රමය, වර්ෂයකට රු. 3,450—90 × 19—රු. 5,160 යනුවෙනි. රජයේ නිලධාරීන්ට අදාළ ප්‍රමාණ හා කොන්දේසි අනුව විවාහක දීමනාවක් ද විවාහක නිලධාරීන්ට ගෙවනු ලැබේ.

3. අවශ්‍ය සුදුසුකම්:—

(අ) වයස : 1970.4.27 දිනට වයස අවුරුදු 30 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුයි.

(ආ) අයදුම්කරුවන් අධ්‍යාපන පොදු සහතික විභාගය (සාමාන්‍ය පෙළ) සමත් වී තිබිය යුතුය. (කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හිමි අය ගැනද සලකා බලනු ඇත).

(ඇ) පැට්රෝල් ඇංජින් හා ඩීසල් ඇංජින් පිළිබඳ මනා දැනුමක් අයදුම්කරුවන්ට තිබිය යුතු අතර, ඔවුන් යටත් පිරිසෙයින් අවුරුදු 7ක් පිළිගත් කර්මාන්තශාලාවක හෝ ප්‍රවාහණ ආයතනයක හෝ මේ හා සමාන තත්ත්වයක තනතුරක සේවය කර තිබිය යුතුයි.

(ඈ) කම්කරු පරිපාලනය පිළිබඳව හා විවිධ වර්ගයේ මෝටර් රථ සුළු වශයෙන් හා සම්පූර්ණයෙන් අලුත් වැඩියා කිරීම් පිළිබඳව ද, රථවාහන සම්බන්ධයෙන් වාර්තා සටහන් තබාගැනීම ගැනද, එසේම වාහනවලට අදාළ ආයුධ හා වෙනත් උපකරණ ආදිය සම්බන්ධයෙන් තොග තැබීම පිළිබඳවද පළපුරුද්ද අයදුම්කරුවන්ට තිබිය යුතුය.

(ඉ) බර වාහන පැදවීමට හැකියාව පිළිබඳ සහතිකයක් ද අයදුම්කරුවන්ට තිබිය යුතුය.

4. මේ ගැසට් පත්‍රයේ iv වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලන්න.

5. ඉල්ලුම්පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත. 1970.4.27 දින හෝ ඊට පෙර ලැබෙන ලෙස එවිය යුතුය.

6. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අවසාන දිනට පෙර ලැබුණු බවට සහතික කර, ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

7. සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

ඒ. බී. සමරජීව,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 මාර්තු මස 20 දින,
තැ. පෙ. 530—කොළඹ.

4–157—70.4.3 දින අංක 14,900 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## පළාත් පාලන සේවය

### පහළ ශ්‍රේණියේ ඉංග්‍රීසි ලඝු ලේඛකයන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය—2 වැනි

පහත නම් සඳහන් අපේක්ෂකයින් දෙදෙනා නමට ඉදිරියෙන් දී ඇති දිනයේදී ඉහත සඳහන් කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්වී ඇති බව මෙයින් දන්වනු ලැබේ.

1. ඩබ්ලිව්. ඒ. ඩී. එෆ්. ජයතිලක මෙනෙවිය ... 1969.3.31
කොළඹ නාගරික සභාව.

2. එස්. ඇලෙක්සැන්ඩර් ... 1969.5.21
මහනුවර නාගරික සභාව.

ඒ. බී. සමරජීව,
ප. පා. සේ. කො. ස. ලේකම්.

1970 මාර්තු මස 23 දින,
තැ. පෙ. 530—කොළඹ.

4–181—70.4.3 දින අංක 14,900 දරන ගැසට් පත්‍රය

---

# පළාත් පාලන සහා ඡන්ද ආඥපනත යටතේ දැන්වීම්

## ප්‍රාදේශීය බලමණ්ඩලීය ඡන්ද විමසීම්වල ප්‍රතිඵලවලට අදළවූ සංඛ්‍යාති

1970 පෙබරවාරි මාසයේ දී පවත්වන ලද ඡන්ද විමසීම්වල ප්‍රතිඵලවල පහත දක්වෙන විස්තර මහජනයාගේ දැන ගැනීම සඳහා ප්‍රසිද්ධ කරනු ලැබේ.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්.
(ප්‍රාදේශීය බලමණ්ඩල).

1970 මාර්තු මස 23 වැනි දින,
කොළඹ දී ය.

### කොළඹ දිස්ත්‍රික්කය

ප්‍රාදේශීය බලමණ්ඩලයේ නම : මොරටුව නගර සභාව — ඡන්ද පැවැත්වූ දිනය : 1970 2 27

| කොට්ඨාශ අංකය හා නම | නාම ලේඛනය අනුව ඡන්දදායක සංඛ්‍යාව | අපේක්ෂකයින්ගේ නම් | නියමවූ සලකුණ | ලැබූ ඡන්ද සංඛ්‍යාව | ප්‍රතික්ෂේප කළ ඡන්ද සංඛ්‍යාව | ප්‍රතික්ෂේපිතවූ ඡන්ද සමග ඡන්දය දුන් මුළු ගණන |
|---|---|---|---|---|---|---|
| 9—මොරටුව නගර සභාව ... | 6,001 ... | කුමාරසිංහ ආරච්චිගේ දොන් ලොරේන් විවියන් ලෙනාර්ඩ් පීරිස් | අලියා ... | 1,804 | 5 ... | 3,546 |
| | | දෙඩම්පහලගේ ජූලියස් ප්‍රැන්සිස් ප්‍රනාන්දු ... | අත ... | 1,702 | | |
| | | අර්සකුලරත්න කුරුකුලසූරිය ප්‍රින්ස්ලි රෙජිනල්ඩ් ප්‍රනාන්දු | කුඩය ... | 35 | | |

### මහනුවර දිස්ත්‍රික්කය

ප්‍රාදේශීය බලමණ්ඩලයේ නම : උඩුනුවර ගඟපලාත දකුණ ගම්සභාව — ඡන්ද පැවැත්වූ දිනය : 1970 2 27

| කොට්ඨාශ අංකය හා නම | නාම ලේඛනය අනුව ඡන්දදායක සංඛ්‍යාව | අපේක්ෂකයින්ගේ නම් | නියමවූ සලකුණ | ලැබූ ඡන්ද සංඛ්‍යාව | ප්‍රතික්ෂේප කළ ඡන්ද සංඛ්‍යාව | ප්‍රතික්ෂේපිතවූ ඡන්ද සමග ඡන්දය දුන් මුළු ගණන |
|---|---|---|---|---|---|---|
| 12—උඩුනුවර ගඟපලාත දකුණ ගම් සභාව | 411 ... | රත්නායක මුදියන්සේලැ ජයවීර ... | අලියා ... | 208 | — ... | 310 |
| | | රත්නායක මුදියන්සේලැ රත්නායක ... | කුරුල්ලා ... | 102 | | |

| කොට්ඨාශ අංකය හා නම | නාමලේඛනය අනුව ඡන්දදායක සංඛාව | අපේක්ෂකයින්ගේ නම් | නියමවූ සලකුණ | ලබාගත් ඡන්ද ගණන | ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද ගණන | ප්‍රතික්ෂේපිතවූ ඡන්ද සමග ඡන්දය දුන් මුළු ගණන |
|---|---|---|---|---|---|---|

## රත්නපුර දිස්ත්‍රික්කය

ප්‍රාදේශීය බලමණ්ඩලයේ නම : රත්නපුර මහා නගර සභාව — මැතිවරණය පැවැත් වූ දිනය : 1970.2.18

| කොට්ඨාශ අංකය හා නම | නාමලේඛනය අනුව ඡන්දදායක සංඛාව | අපේක්ෂකයින්ගේ නම් | නියමවූ සලකුණ | ලබාගත් ඡන්ද ගණන | ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද ගණන | ප්‍රතික්ෂේපිතවූ ඡන්ද සමග ඡන්දය දුන් මුළු ගණන |
|---|---|---|---|---|---|---|
| 9—වරකතොට | 1,157 | 1. පෙරේරා, ඩබ්ලිව්. ජී. ඇම්. ඇල්බට් | අලියා | 464 | 2 | 893 |
| | | 2. මයිල්වාගනම් සිවසූරියම් | අත | 371 | | |
| | | 3. මරික්කාර්, එම්. ජේ. ආර්. | දෙඩම්ගෙඩිය | 56 | | |

## රත්නපුර දිස්ත්‍රික්කය

ප්‍රාදේශීය බලමණ්ඩලයේ නම : රක්වාන සුළු නගර සභාව — මැතිවරණය පැවැත් වූ දිනය :1970.2.20

| කොට්ඨාශ අංකය හා නම | නාමලේඛනය අනුව ඡන්දදායක සංඛාව | අපේක්ෂකයින්ගේ නම් | නියමවූ සලකුණ | ලබාගත් ඡන්ද ගණන | ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද ගණන | ප්‍රතික්ෂේපිතවූ ඡන්ද සමග ඡන්දය දුන් මුළු ගණන |
|---|---|---|---|---|---|---|
| 1—අළුත්පාරගොඩ | 95 | සිමියොන්, ඩබ්ලිව්. | අත | 43 | 1 | 78 |
| | | සෝමපාල, කේ. කේ. | ලාම්පුව | 34 | | |

## රත්නපුර දිස්ත්‍රික්කය

ප්‍රාදේශීය බලමණ්ඩලයේ නම : කුරුවිටිකෝරලේ මැද පත්තු ගම් සභාව — මැතිවරණය පැවැත් වූ දිනය : 1970.2.9

| කොට්ඨාශ අංකය හා නම | නාමලේඛනය අනුව ඡන්දදායක සංඛාව | අපේක්ෂකයින්ගේ නම් | නියමවූ සලකුණ | ලබාගත් ඡන්ද ගණන | ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද ගණන | ප්‍රතික්ෂේපිතවූ ඡන්ද සමග ඡන්දය දුන් මුළු ගණන |
|---|---|---|---|---|---|---|
| 4—නුගදණ්ඩ ඉහලගම | 682 | සයිමා, පී. ඩී. | අලියා | 303 | 2 | 525 |
| | | හිඳුරංගල ගමරාල්ලාගේ පේමදාස | යතුර | 220 | | |

## රත්නපුර දිස්ත්‍රික්කය

ප්‍රාදේශීය බලමණ්ඩලයේ නම : කුරුවිට ගම් සභාව — මැතිවරණය පැවැත් වූ දිනය : 1970.2.13

| කොට්ඨාශ අංකය හා නම | නාමලේඛනය අනුව ඡන්දදායක සංඛාව | අපේක්ෂකයින්ගේ නම් | නියමවූ සලකුණ | ලබාගත් ඡන්ද ගණන | ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද ගණන | ප්‍රතික්ෂේපිතවූ ඡන්ද සමග ඡන්දය දුන් මුළු ගණන |
|---|---|---|---|---|---|---|
| 19—කඳන්ගොඩ | 684 | 1. හීන්මහත්මයා, කේ. ඇම්. | තරුව | 291 | 2 | 504 |
| | | 2. ඩිංගිරිමහත්මයා, පී. | අලියා | 167 | | |
| | | 3. සමරසිංහ, කේ. ඇම්. | ලාම්පුව | 39 | | |
| | | 4. රතුබිලිඳලාගේ සුරහනා | කුඩය | 05 | | |

4–170—70.4.3. දින අංක 14,900 දරන ගැසට් පත්‍රය

---

## ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත (262 වැනි අධිකාරය)

ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වැනි අධිකාරය වන) 66(2) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලබන්නේ, මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අපේක්ෂකයින් ඔවුන්ගේ නම්වලට කෙලින් ඇති ඒ ඒ කොට්ඨාශයේ නියෝජිතයන් වශයෙන් පෙනී සිටීම සඳහා තෝරා පත් කරන්නට යෙදුන බවය.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්,
(ප්‍රාදේශීය බලමණ්ඩල).

1970 මාර්තු මස 19 වැනි දින,
කොළඹදීය.

### උපලේඛනය

| කොට්ඨාශ අංකය | අපේක්ෂකයාගේ නම |
|---|---|
| **කොළඹ දිස්ත්‍රික්කය** | |
| **මෙගොඩපොත ගම්සභාව** | |
| 19 | කුඩා සිංගන්කුට්ටි කන්කානමලාගේ දාවිත් සිංඤෝ. |
| **කළුතර දිස්ත්‍රික්කය** | |
| **වැලිපැන්න ගම්සභාව** | |
| 9 | මද්දුමාගේ පියදාස. |

4–171—70.4.3 දින අංක 14,900 දරන ගැසට් පත්‍රය

---

## ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත (262 වැනි අධිකාරය)

ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වැනි අධිකාරය වන) 36 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලබන්නේ, මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අපේක්ෂකයින් ඔවුන්ගේ නම්වලට ඇති ඒ ඒ කොට්ඨාශයේ නියෝජිතයින් වශයෙන් පෙනී සිටීම සඳහා තෝරා පත් කරන්නට යෙදුන බවය.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්,
(ප්‍රාදේශීය බලමණ්ඩලය).

1970 මාර්තු මස 19 වැනි දින,
කොළඹදීය.

### උපලේඛනය

| කොට්ඨාශ අංකය | අපේක්ෂකයාගේ නම |
|---|---|
| **මහනුවර දිස්ත්‍රික්කය** | |
| **මැදදුම්බර මැදසියපත්තු ගම්සභාව** | |
| 4 | ඒකනායක මුදියන්සේලාගේ හකුරු අබේගෙදර මුතුබණ්ඩා. |
| **මාතලේ දිස්ත්‍රික්කය** | |
| **ගහල පල්ලේසිය පත්තු ගම් සභාව** | |
| 9 | දවුන්ඩ වික්‍රමසිංහ රාජපක්ෂ වාසල මුණසිංහ මුදියන්සේලාගේ අළුත්වලව්වේ කපිලරත්න බණ්ඩා. |

4–172—70.4.3 දින අංක 14,900 දරන ගැසට් පත්‍රය

# ආදයම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන

## පූඩලුඔය සුළු නගර සභාව

### 1968 වර්ෂයේ දෙසැම්බර් මස 31 දිනට ඇති වත්කම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය

**බැරකම**

| | | | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|---|---|
| තැන්පත්— | | | | | |
| සාමාන්‍යය | ... | | 9,783 92 | | |
| විදුලිය | ... | | 7,436 07 | | |
| | | | | | 17,219 99 |
| රජයේ ආධාර— | | | | | |
| ජලය සැපයීම | ... | | 6,283 65 | | |
| පාරවල් | ... | | 9,119 30 | | |
| පැතිකාණු | ... | | 76 25 | | |
| ක්‍රීඩා භූමි | ... | | 524 0 | | |
| පුස්තකාල | ... | | — | | |
| | | | | | 16,003 20 |
| ණය මුදල් | ... | | | | 711 80 |
| විවිධ ණය හිමියෝ | ... | | | | 25,567 79 |
| විදුලිය ක්ෂය ගිණුම | ... | | | | 2,250 0 |
| අතිරික්තය හා ඌණතා ගිණුම (සාමාන්‍යය) | | | | | |
| 68.1.1 දිනට අධිකය | ... | රු. ශ· | 20,425 37 | 20,425 37 | |
| 68.12.31 අය | ... | 74,122 11 | | | |
| | | 1,097 87 | | | |
| | | | 75,219 98 | | |
| 68.12.31 වැය | ... | 64,066 96 | | | |
| | | 21 52 | | | |
| | | | 64,088 48 | | |
| | | | | 11,131 50 | |
| | | | | | 31,556 87 |
| | | | | | 93,309 65 |

**වත්කම**

| | | | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|---|
| අත්තිකාරම් | ... | | | 935 47 |
| විවිධ ණය ගැතියෝ | ... | | | 17,096 89 |
| හිඟ බදු මුදල්— | | | | |
| දේපල බදු | ... | | 14,137 30 | |
| මලපවාහන බදු | ... | | 2,299 06 | |
| විදුලිය ගාස්තු | ... | | 5,108 36 | |
| කුලී | ... | | 120 0 | |
| වරෙන්තු ගාස්තු | ... | | 931 47 | |
| | | | | 22,596 19 |
| අචල තැන්පත් | ... | | | 25,000 0 |
| මුදල් පොතේ ශේෂය | ... | | | 25,275 44 |
| අතිරික්තය හා ඌණතා ගිණුම (විදුලිය) | | | | |
| 68.1.1 දිනට අධිකය | ... | රු. ශ. | 3,966 91 | |
| 68.12.31 දක්වා වැය | ... | 41,712 04 | | |
| 68.12.31 දක්වා අය | ... | 35,339 47 | | |
| | | | 6,372 57 | |
| ඌණතාවය ... | | | | 2,405 66 |
| | | | | 93,309 65 |

පූඩලුඔය සුළු නගර සභාවේ සභාපති තැන්පත් ඉලම් පෙරුම ආරච්චිගේ ප්‍රැන්සිස් අප්පුහාමි වන මම, ඉහත සඳහන් වාර්තාව මගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1968.12.31 දිනට පූඩලුඔය සුළු නගර සභාවේ වත්කම් හා බැරකම් පිළිබඳ සත්‍යවූත් නිවැරදිවූත් වාර්තාවක් බව මෙයින් සහතික කරමි.

හේ. මු. වීරසේන,
අංක 2 කොට්ඨාශයේ නියෝජිත.
1969 පෙබරවාරි මස 6 දින මා ඉදිරිපිටදී පූඩලුඔයේදී සහතික කරණ ලදී.

ඊ. පී. ඒ. ප්‍රැන්සිස් අප්පුහාමි,
සභාපති.

දෙන් ප්‍රැන්සිස් සේනානායක,
සාම විනිසකරු.

## පූඩලුඔය සුළු නගර සභාව

### 1968 වර්ෂයේ ආදයම් හා වියදම් පිළිබඳ ප්‍රකාශය

**ආදයම්**

| | | | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|---|
| ඒ.—සාමාන්‍ය ආදයම් | ... | ... | 48,176 37 | |
| බී.—මහා මාර්ග | ... | ... | 442 88 | |
| සී.—නගර සභා ඉඩම් හා ගොඩනැගිලි | | ... | 618 0 | |
| ඩී.—මහජන සෞඛ්‍යය | ... | ... | 13,245 71 | |
| ඊ.—මහජන විනෝදය | ... | ... | 10,938 15 | |
| ඇප්.—සොහොන් බිම් | ... | ... | — | |
| ජී.—සුනඛයින් ලියා පදිංචි කිරීම | | ... | 1 0 | |
| ජේ.—කියවීම් ශාලා හා පුස්තකාල | | ... | 700 0 | |
| | | | | 74,122 11 |
| **වෙනත් ආදයම්** | | | | |
| 1. තැන්පත් | ... | ... | 15,465 18 | |
| 2. අත්තිකාරම් | ... | ... | 2,267 13 | |
| 3. විදුලිය ගිණුම | ... | ... | 35,339 47 | |
| 4. අතිරික්තය හා ඌණතා ගිණුම | | ... | 1,097 87 | |
| 5. විවිධ ණය ගැතියෝ | ... | ... | 7,193 98 | |
| 6. විවිධ ණය හිමියෝ | ... | ... | 14,824 69 | |
| 7. විදුලිය ක්ෂය සංචිතය | | ... | 500 0 | |
| 8. අචල තැන්පත් | ... | ... | — | |
| 9. වැඩිපුර ගෙවීම් ආපසු ලැබීම් | | ... | 32 0 | |
| | | | | 76,720 32 |
| **ආදයම් එකතු කිරීමේ ගිණුම්** | | | | |
| (ඒ) දේපල බදු | ... | ... | 12,878 91 | |
| (බී) මලපවාහන බදු | ... | ... | 1,871 51 | |
| (සී) කුලී | ... | ... | 552 0 | |
| (ඩී) වරෙන්තු ගාස්තු | ... | ... | 99 47 | |
| (ඊ) විදුලිය ගාස්තු | ... | ... | 27,608 85 | |
| | | | | 43,010 74 |
| 1967 දෙසැම්බර් මස 31 දිනට ශේෂය | ... | | | 43,723 73 |
| | | | | 2,37,576 90 |

**වියදම්**

| | | | රු. ශ. | රු. ශ· |
|---|---|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් | ... | ... | 26,949 38 | |
| බී.—මහා මාර්ග | ... | ... | 4,710 23 | |
| සී.—නගර සභා ඉඩම් හා ගොඩනැගිලි | | ... | 3,609 19 | |
| ඩී.—මහජන සෞඛ්‍යය | ... | ... | 25,700 21 | |
| ඊ.—මහජන විනෝදය | ... | ... | 1,328 02 | |
| ඇප්.—සොහොන් භූමි නඩත්තුව | | ... | 11 10 | |
| ජී.—සුනඛයින් ලියා පදිංචිය | | ... | 9 50 | |
| ජේ.—කියවීම් ශාලා හා පුස්තකාල | | ... | 1,749 33 | |
| | | | | 64,066 96 |
| **වෙනත් වියදම්** | | | | |
| 1. තැන්පත් | ... | ... | 18,497 98 | |
| 2. අත්තිකාරම් | ... | ... | 2,172 50 | |
| 3. විදුලිය ගිණුම | ... | ... | 41,712 04 | |
| 4. අතිරික්තය හා ඌණතා ගිණුම | | ... | 21 52 | |
| 5. විවිධ ණය හිමියෝ | ... | ... | 14,658 74 | |
| 6. විවිධ ණය ගැතියෝ | ... | ... | 9,079 47 | |
| 7. විදුලිය ක්ෂය සංචිතය | | ... | — | |
| 8. අචල තැන්පත් | ... | ... | 15,000 0 | |
| 9. වැඩිපුර ගෙවීම් ආපසු : ගිණුම් | | ... | 32 0 | |
| | | | | 1,01,174 25 |
| **ආදයම් එකතු කිරීමේ ගිණුම්** | | | | |
| (ඒ) දේපල බදු | ... | ... | 17,934 85 | |
| (බී) මලපවාහන බදු | ... | ... | 2,190 51 | |
| (සී) කුලී | ... | ... | 608 0 | |
| (ඩී) වරෙන්තු ගාස්තු | ... | ... | 84 43 | |
| (ඊ) විදුලිය ගාස්තු | ... | ... | 26,242 46 | |
| | | | | 47,060 25 |
| 1968 වර්ෂයේ දෙසැම්බර් මස 31 දිනට ශේෂය... | | | | 25,275 44 |
| | | | | 2,37,576 90 |

පූඩලුඔය සුළු නගර සභාවේ සභාපති නැන්පත් ඉලම්පෙරුම ආරච්චිගේ ප්‍රැන්සිස් අප්පුහාමි වන මම, ඉහත සඳහන් වාර්තාව මගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1968 වර්ෂයේ පූඩලුඔය සුළු නගර සභාවේ ආදායම් හා වියදම් පිළිබඳ සත්‍යවූත්, නිවැරදිවූත් වාර්තාවක් බව සහතික කරමි.

හේ. මු. වීරසේන,
අංක 2 කොට්ඨාශයේ නියෝජිත.

ඊ. පී. ඒ. ප්‍රැන්සිස් අප්පුහාමි,
සභාපති.

1969 වර්ෂයේ පෙබරවාරි මස 6 දින පූඩලුඔය දී මා ඉදිරිපිටදී සහතික කරන ලදී.

දෙන් ප්‍රැන්සිස් සේනානායක,
සාම විනිසකරු.

4–176—70.4.3 දින අංක 14,900 දරන ගැසට් පත්‍රය

---

# අය-වැය ලේඛන

## වාද්දුව උප නගර සභාව

### 1970 අංක 1 දරණ අතුරු වැය ලේඛණය

### II කොටස—විදුලිය

| | රු. | ශ. |
|---|---|---|
| ඊ. එල්. 6—දීර්ග කිරීම හා දියුණු කිරීම ... ... | 6,000 | 0 |

1970 මාර්තු මස 12 වන දින පැවැත්වූ සභා රැස්වීමේ අංක 14 දරණ යෝජනාවෙන් සම්මත විය.

ඇම්. ඩී. ඒ. ගුණතිලක,
සභාපති, වාද්දුව උප නගර සභාව.

1970 මාර්තු මස 14 වෙනි දින,
වාද්දුව උප නගර සභා කාර්යාලයයේදීය.

සංශෝධනය කර අනුමත කරමි.

කේ. එම්. අබේසිංහ,
සහකාරප ළාත් පාලන කොමසාරිස් තුමා, කළුතර.

1970 මාර්තු මස 23 දින,
පළාත් පාලන අමාත්‍යාංශයේ කළුතර කාර්යාලයය,

4–152—70.4.3 දින අංක 14,900 දරණ ගැසට් පත්‍රය

---

## අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාව

### මුදල් රෙගුලාසි 12 (II) යටතේ කෙරෙන අයදුම් පත්‍රය

### 1970 අයවැය ලේඛණය

1970 අයවැය ලේඛණයේ ඒ ඒ ශීර්ෂයන් යටතේ වෙන් කරන ලද මුදල් වලින් ඉතිරිවේ යයි ගණන් බලන ලද පහත දක්වෙන වැය ශීර්ෂ යටතේ සඳහන් මුදල් ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂ වලට මාරුකර, අවශ්‍ය වී තිබෙන අතිරේක වැය සඳහා එම ශීර්ෂ යටතේ යෙදීමට 1970.3.4 වෙනි දින පවත්වන ලද විශේෂ රැස්වීමේ දී අංක 1 දරණ සභා තීරණයෙන් සම්මත වී තිබේ.

| 1970 අයවැය ලේඛණයේ වෙන්කර තිබෙන මුදල් වලින් ඉතිරිවේයයි ගණන් බලන ලද ශීර්ෂයන් හා මුදල් | රු. | ශ. | අතිරේක වැය අවශ්‍ය වී තිබෙන ශීර්ෂයන් හා මුදල් | රු. | ශ. |
|---|---|---|---|---|---|
| ඊ.—මහජන සෞඛ්‍යය :— | | | ඒ.—සාමාන්‍ය වියදම් :— | | |
| (5) ජල සම්පාදනය : | | | (4) ආධාර සහ දීමනා : | | |
| (ඒ) පඩිනඩි ... ... ... | 2,000 | 0 | (අ) දිළිඳු ළමයින්ට පාසැල් පොත් නොමිලයේ සැපයීම... | 2,000 | 0 |
| එකතුව ... | 2,000 | 0 | එකතුව ... | 2,000 | 0 |

ආනන්ද සෝමවීර,
සභාපති,
අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාව.

පළාත් ආණ්ඩු සභා කාර්යාලය,
අවිස්සාවේල්ල.
1970 මාර්තු මස 21 වෙනි දින.

4–155—70.4.3 දින අංක 14,900 දරන ගැසට් පත්‍රය

---

# විවිධ දැන්වීම්

## අක්බෝපුර ගම්සභාව

### ගෝඝාතක ආඥපනත

මෙහි පහත දක්වෙන උප ලේඛනයේ සඳහන් අය විසින්, මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1970 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලුම්කර තිබෙන බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත්කිරීම ගැන අක්බෝපුර ගම්සභා සීමාව තුළ පදිංචි යම් කෙනකු විරුද්ධ වන්නේනම් එසේ විරුද්ධවීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුතු ලියවිල්ලකින් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළතදී මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, 272 වන අධිකාරය වන ගෝඝාතක ආඥපනතේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දනුම්දෙමි.

#### උප ලේඛනය

| ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | ස්ථානය | වෙළඳාමේ පිළිවෙල |
|---|---|---|
| ඇම්. ඇස්. ඇම්. නයීම්, අංක 141, මුස්ලිම් ජනපදය, අක්බෝපුර ... | අක්බෝපුර මුස්ලිම් ජනපදයේ අංක 141 දරණ ස්ථානය | එළ හරක් මස් විකිණීම |

පී. එල්. සිරිසේන,
අග්බෝපුර ගම්සභාවේ සභාපතිතැන.

ගම්සභා කාර්යාලය,
බටුකච්චිය, අග්බෝපුර,
1970 මාර්තු මස 24 වෙනි දින.

4–160—70.4.3 දින අංක 14,900 දරන ගැසට් පත්‍රය

## අම්බලන්තොට සුළු නගර සභාව

### ජලභීතිකා රෝගය

අම්බලන්තොට නගර සීමාව තුළ ජලභීතිකා රෝගය උවදුර පවතින බැවින්, එම නගර සීමාව තුළ පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක නොවන්නාවූ අන්‍ය ප්‍රසිද්ධ ස්ථානයක හෝ පාරක හමුවන, දඬාවතේ යන නැතහොත් බැඳ නොතබන ලද්දාවූ හෝ දක්කාගෙන නොයනු ලබන්නාවූ කිසියම් සුනඛයකු, බල්ලකු හෝ බැල්ලියක, මා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන අයකු විසින් එවේලෙහිම විනාශ කරනු ලබන බව, ලංකාවේ ව්‍යවස්ථාපිත ප්‍රඥප්ති සංග්‍රහයේ 476 වෙනි පරිච්ඡේදය වන, ජල භීතිකා ආඥාපනතේ 11 වෙනි වගන්තියේ ප්‍රකාර මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

මෙම ප්‍රකාශය 1970 වර්ෂයේ දෙසැම්බර් 31 වන දින දක්වා වලංගු වන්නේ ය.

කේ. සමරරත්න,
සභාපති,
සුළු නගරසභාව, අම්බලන්තොට.

1970.4.20 වෙනි දින,
අම්බලන්තොට සුළු නගර සභා කාර්යාලයේදීය.

4–173—70.4.3 දින අංක 14,900 දරන ගැසට් පත්‍රය

---

## දළුගම සුළු නගර සභාව

### 1970 වර්ෂයේ වරිපනම් ලේඛන

1970 වර්ෂය වෙනුවෙන් පිළියෙල වී ඇති දළුගම සුළු නගර සභාවේ වරිපණම් ලේඛන කාර්යාලයීය වේලාව තුළ මෙම කාර්යාලයේදී පරික්ෂා කිරීම පිණිස විවෘතව ඇති බව (256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 165 වැනි වගන්තියේ කියවෙන (252 වැනි අධිකාරය වන) මහ නගර සභා ආඥාපනතේ 235 (1) වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩී. ඒ. පියදාස,
සභාපති,
දළුගම සුළු නගර සභාව.

දළුගම සුළු නගර සභා කාර්යාලය,
මහර-කඩවත,
1970 ක්වූ මාර්තු මස 19 වැනි දින දීය.

4–167—70.4.3 දින අංක 14,900 දරන ගැසට් පත්‍රය

---

## පිළියන්දල සුළු නගර සභාව

### 1970 වරිපනම් ලේඛනය

1970 වර්ෂය සඳහා පිළියන්දල සුළුනගර සභාවේ වරිපණම් ලේඛන දැනට සූදානම් බවත් එම ලේඛන කාර්යාල වේලාවන්හිදී මෙම කාර්යාලයේදී පරික්ෂාකර බැලීම සඳහා තබා ඇති බවත් (256 වැනි අධිකාරිය) සුළු නගර සභා ආඥා පණතේ 165 වැනි වගන්තියෙන් කියවෙන පරිදි (252 වැනි අධිකාරය වන) මහ නගරසභා ආඥා පනතේ 235 (1) දරණ වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

සී. ඩී. ප්‍රේමරත්න,
සභාපති,
පිළියන්දල සුළු නගරසභාව.

1970 මාර්තු 18 වෙනිදින,
පිළියන්දල සුළු නගර සභා කාර්යාලයේදීය.

462—70.4.3 දින අංක 14,900 දරන ගැසට් පත්‍රය

---

## තාරණ ගම්සභාව

### ගම්සභා ආඥාපනත—198 වෙනි පරිච්ඡේදය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ කරඳාපත්තුකෝරළේ තාරණ ගම්සභාව විසින් සම්මත කරගන්නා ලද පහත දැක්වෙන යෝජනාව මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

ආර්. බී. පඩිවෙල,
තාරණ ගම්සභාවේ සභාපති.

තාරණ ගම්සභා කාර්යාලය,
මාදුලුපිටිය,
තාරණ–උඩවෙල,
1970 මාර්තු මස 20 වෙනි දින.

### යෝජනාව

පළාත් පාලන ඇමතිවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1953 ක්වූ අප්‍රේල් මස 10 වෙනි දින අංක 10,514 දරණ ගැසැට් පත්‍රයේ පලකරන ලද්දවූද උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් සම්මත කරගන්නා ලද්දවූ බව 1953 ක්වූ අගෝස්තු මස 7 වෙනි දින අංක 10,560 දරණ ගැසැට් පත්‍රයේ නිවේදනයකින් ප්‍රකාශ කරන ලද්දවූද, අතුරු ව්‍යවස්ථා ප්‍රකාර තාරණ ගම්සභාව මගින් 1967 පෙබරවාරි මස 28 වෙනි දින රැස්වීමේදී සම්මත කරගනු ලැබූ 1967 තේ මාර්තු මස 23 වෙනි දින අංක 14,741 දරණ ලංකාණ්ඩුවේ ගැසැට් පත්‍රයේ පලකරන ලද පොදු අතුරු ව්‍යවස්ථාවල 4 වැනි කාණ්ඩයේ 1 වැනි වගන්තියේ යෝජනාවේ සඳහන් එකී ගම්සභා බලසීමාවට අයත් වන මංමාවත් හා අඩිපාරවල්ද ඇතුලුව මෙහි පහත උපලේඛණයෙහි දැක්වෙන මංමාවත් හා අඩිපාරවල්වල එකිනෙක ඉදිරියෙන් සඳහන් දිග හා පළල අනුව සාද හෝ නැවත සාද හෝ පවත්වා ගෙන යායුතු යසී ගම්සභා නියෝජිත ජේ. වී. අබේකෝන් මහතා විසින් ඉදිරිපත් කළ යෝජනාව පී. ඇම්. කපුරුහාමි මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකච්ඡන්දයෙන් සභා සම්මත විය.

#### කොට්ඨාශ අංක 3—හමන්නාපහුව

| | පාරේ නම | පාරේ දිග යාර | පාරේ පළල අඩි |
|---|---|---|---|
| 1. | කෝන්කඩවල–උස්වැව පාරේ සිට හිරිගොල්ල ගංගොඩ පාර ... ... | 607 ... | 14 |
| 2. | හන්තිහව–හමන්නාපහුව පාරේ සිට රුක්කත්තන ගංගොඩ පාර ... ... ... | 234 ... | 16 |
| 3. | හන්තිහව–හමන්නාපහුව පාරේ සිට වල්ලව වැව දක්වා පාර ... ... ... | 216 ... | 16 |
| 4. | හන්තිහව–හමන්නාපහුව පාරේ සිට මහවැවපාවුල ගංගොඩ දක්වා ... ... | 200 ... | 16 |
| 5. | මාදුලුපිටිය වල්ලව ගම්මායිම් පාරේ සිට වල්ලව ගල්වල ගංගොඩට ... ... | 202 ... | 16 |
| 6. | නිකවත්ත සිට යකාකොටුව වත්තට හා ගංගොඩට යන පාර ... ... ... | 147 ... | 16 |
| 7. | වල්ලව කරඹයාය සුසාන භූමියට යන පාර ... | 233 ... | 16 |
| 8. | හමන්නාපහුව මහවැවට යන පාර ... ... | 133 ... | 16 |

#### කොට්ඨාශ අංක 4—කැලෑගෙදර

| | පාරේ නම | පාරේ දිග යාර | පාරේ පළල අඩි |
|---|---|---|---|
| 1. | අනුක්කන ගම හරහා වෙලට යන පාර ... | 318 ... | 8 |
| 2. | බරාගෙදර පන්සල් මායිම් පාර ... ... | 120 ... | 10 |
| 3. | කුඹුක් පුරාණහේන හරහා පිරිස්වත්ත මැදින් යන පාර ... ... ... | 1,702 ... | 14 |

4–150—70.4.3 දින අංක 14,900 දරන ගැසට් පත්‍රය

## හැඳල සුළු නගර සභාව

### ජල භීතිකා රෝගය

හැඳල සුළු නගර සභා සීමාව තුල ජලභීතිකා රෝග උවදුර පවතින බැවින්, එම නගර සීමාව තුල පිහිටි පුද්ගලික ගොඩනැගිල්ලක ගෙමිදුලක හෝ ගෙවත්තක නොවන්නාවූ අන්‍ය ස්ථානයක හෝ පාරක හමුවන හෝ දඬාවතේ යන නැතහොත් බැඳ නොතබන්නාවූ හෝ දක්කාගෙන නොයනු ලබන්නාවූ කිසියම් සුනඛයකු (බල්ලකු හෝ බැල්ලියක) මා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන අයකු විසින් එවෙලෙහිම විනාශකරණු ලබන බව (ලංකාවේ ව්‍යවස්ථාපිත ප්‍රඥප්ති සංග්‍රහයේ 476 වෙනි පරිච්ඡේදය වන) ජලභීතිකා ආඥ පණතේ 11 වන වගන්තියේ ප්‍රකාර මෙයින් ප්‍රකාශකරනු ලැබේ.

මෙම ප්‍රකාශනය ගැසට් පත්‍රයේ පළවන දින සිට හයමාසයක කාල යක් තුල බලපවත්වනවා ඇත.

ඒ. ඞී. විල්බට්,
හැඳල සුළු නගර සභාවේ සභාපති.

1970 මාර්තු මස 20 දින දීය,
හැඳළ සුළු නගර සභා කායඝාලය.

4–158—70.4.3 දින අංක 14,900 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ දිස්ත්‍රික්කයේ—ආඬිඅම්බලම ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පනතේ (272 වන අධිකාරය) 17 (1) ඡේදය යටතේ නියෝගය

ඉහත සඳහන් කාරණය සම්බන්ධයෙන් අංක 14,890 සහ 1970.1.23 දින ලංකා ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ (IV කොටස) 89 වැනි පිටුවේ දැක්වෙන දැන්වීමට පහත උප ලේඛනයේ දැක්වෙන දිනයද ඇතුළත් කොට වැඩිදුරටත් මෙයින් සංශෝධනය කරමි.

තවද කටුනායක අංක 1, කටුනායක අංක 2, කුරණ-කටුනායක යන මස්කඩ වෙනුවෙන් 1970 වර්ෂයේ මාර්තු 27, මැයි 20, 21 සහ ඔක් තෝබර් 4 යන දින 4 හැර අනිකුත් දින බලපාන්නේ නැත.

### උපලේඛනය

1970 මාර්තු 27 වැනි දින (මහසිකුරාදා.)

කේ. ඞී. එච්. ද ඇස්. කරුණාරත්න,
සභාපති,
ආඬිඅම්බලම ගම්සභාව.

ආඬිඅම්බලම ගම්සභා කාර්යාලය,
සීදූව,
1970.3.23 වන දින.

4–163—70.4.3 දින අංක 14,900 දරන ගැසට් පත්‍රය

ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**

(සැම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. පෝය දින වලට පෙරදින පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද, වෙනත් දිනවල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුයි.

4. පෝය දිනවලට පෙරදින දවල් 12 ට සහ වෙනත් දිනවල පස්වරු 3.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශන යන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක්පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත "පිටපත" කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සැම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම් පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 20 | 0 |
| වැඩිවන සැම අඟලකට හෝ ඉන් කොටසකට ... ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 440 | 0 |

අඟලේ සැම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සැම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සැම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

**12. 1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සැම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමෙ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ, මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.**

13. 68.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු—

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට රු. | ශ. | | පිටරට රු. | ශ. |
|---|---|---|---|---|---|
| එක් කොටසක් ... ... ... | 46 | 0 | ... | 60 | 0 |
| I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 36 | 0 | ... | 42 | 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් ... ... | 43 | 50 | ... | 51 | 50 |

**වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනු‍ලයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.**

**තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ රු. ශ. | | තැපැල් ගාස්තු මෙරට රු. ශ. |
|---|---|---|---|
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුලතදී එක කොටසක් ... ... ... | 0 50 | ... | 0 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... ... ... | 1 00 | ... | 0 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 30 | ... | 0 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 60 | ... | 0 15 |

**දායක මුදල් භාර ගැනීම සහ තනි පිටපත් විකිණීම භාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.**

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උප ලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය.

### උපලේඛනය

### 1970

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| මාර්තු ... | 70. 3. 5 බ්‍රහස්පතින්ද ... | 70. 2.27 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 3.13 සිකුරාද ... | 70. 3. 5 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 3.20 සිකුරාද ... | 70. 3.13 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 3.26 බ්‍රහස්පතින්ද ... | 70. 3.19 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| අප්‍රේල් ... | 70. 4. 3 සිකුරාද ... | 70. 3.25 බදාදා | ප.ව. | 3.30 |
| | 70. 4.10 සිකුරාද ... | 70. 4. 3 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 4.17 සිකුරාද .. | 70. 4. 8 බදාදා | ප.ව. | 3.30 |
| | 70. 4.24 සිකුරාද ... | 70. 4.17 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 4.30 බ්‍රහස්පතින්ද .. | 70. 4.23 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| මැයි ... | 70. 5. 8 සිකුරාද ... | 70. 4.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 5.15 සිකුරාද .. | 70. 5. 8 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 5.22 සිකුරාද ... | 70. 5.15 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 5.29 සිකුරාද ... | 70. 5.22 සිකුරාද | ප.ව. | 3.30 |
| ජූනි ... | 70. 6. 5 සිකුරාද ... | 70. 5.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.11 බ්‍රහස්පතින්ද ... | 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.18 බ්‍රහස්පතින්ද ... | 70. 6.11 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 6.25 බ්‍රහස්පතින්ද ... | 70. 6.18 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 මාර්තු මස 5 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයයි.